# විදේශ අමාත්‍ය මංගල සමරවීර සමග පැවැත්වූ සාකච්ඡාවෙන් පසුව සහකාර ලේකම් නිෂා බිස්වාල් හා සහකාර ලේකම් ටොම් මැලිනොව්ස්කි මාධ්‍යයට දැක්වූ අදහස්

ජූලි 12, 2016

**සහකාර ලේකම් නිෂා බිස්වාල්**

අපට දැක්වූ ඉතා උණුසුම් හා ආචාරශීලී පිළිගැනීම ගැන මෙන් ම අද පැවති ඉතා ඵලදායී සාකච්ඡාව ගැන ඇමතිතුමාට ස්තුතියි. අපේ සංචාරය හා සාකච්ඡා පදනම් වූයේ අපේ රටවල් දෙක අතර සහයෝගිතාවේ දැවැන්ත ගමන් මග සනිටුහන් කරන, ලේකම් කෙරී හා තානාපති සමන්තා පවර් ගේ පසුගිය වසරේ සංචාරයන් හා මෙම වර්ෂයේ පෙබරවාරි මාසයේ ආරම්භ වූ සහයෝගිතා සංවාදය ඇතුළු එම සබඳතාවේ ප්‍රධාන අඩියර ගණනාවක් මතයි.

රටට අභියෝගයක් වී ඇති අභ්‍යන්තර ප්‍රශ්නවලට අවධානය යොමු කිරීමට පමණක් නොව සහයෝගිතා හා සංවාදී නැඹුරුවකින් යුතු ව පුළුල් ජාත්‍යන්තර ප්‍රජාව සමග කටයුතු කිරීමේ මාවතකට ද ශ්‍රී ලංකාව අවතීර්ණ වී තිබේ. අප දෙ රට අතර සබඳතා ශක්තිමත් වීම එක්සත් ජනපදය අගය කරයි. මානව හිමිකම් හා මූලික නිදහස ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කරන එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාවට ප්‍රජාතන්ත්‍රවාදී රටවල් ලෙස ඇත්තේ පොදු අභිමතාර්ථයන් ය. අපි හවුල්කරුවන් වන අතර අපේ සබඳතා අද කිසි දිනක නො තිබූ තරම් ඉහළ මට්ටමක තිබේ.

පසුගිය අවුරුදු 60කට වැඩි කාලයක් අප ශ්‍රී ලංකාව සමග සහයෝගයෙන් කටයුතු කර ඇති අතර ඒ කාලය තුළ ලබා දුන් සංවර්ධන හා මානුෂීය ආධාර නිසා ශ්‍රී ලංකාව පුරා ජනයාගේ ජීවිත, ජීවනෝපායන් හා ජීවන තත්වයන් දියුණු වී තිබේ. අපි දිගටම කෘෂිකර්මය, ව්‍යවසාය සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය, බල ශක්ති හා ස්වාභාවික සම්පත් හා මානුෂීය කටයුතු ආදී බහුවිධ ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු ආයෝජනයන් කරමු. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මෙන් ම යුක්තිය හා ප්‍රතිසන්ධානය කරා ශ්‍රී ලංකාව යන ගමනේ දී ආර්ථික සංවර්ධනය ඇති කිරීමටත්, විදේශ ආයෝජන දිරි ගැන්වීමටත් සියලු ශ්‍රී ලාංකිකයන්ට වැඩිපුර අවස්ථා ලබා දීමටත් එක්සත් ජනපදය දිගටම ශ්‍රී ලංකා රජය සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

ප්‍රජාතන්ත්‍රීය පාලනය, මානව හිමිකම්වලට ගරු කිරීම, ප්‍රතිසන්ධානය, යුක්තිය හා වගවීම ආදී රටේ ජනතාවගේ ප්‍රශ්නවලට ප්‍රතිචාර දක්වමින් නිශ්චිත හා අර්ථවත් පියවර ගන්නා ශ්‍රී ලංකා රජයට අපි දිගටම සහයෝගය දක්වමු. මෙම කලාපයේ ප්‍රධාන සහ කරුවෙක් ලෙස ශ්‍රී ලංකාව වැඩිතර කාර්ය භාරයක් ඉටු කරන විට ඉන්දියානු සාගරය හරහා සාමය, සමෘද්ධිය

හා ආරක්ෂාව තහවුරු කෙරෙන අනාගතයක් අප රටවල් දෙකට ම ප්‍රතිලාභ ගෙන එනු ඇත. දකුණු හා අග්නිදිග ආසියාවේ නැගී එන ආර්ථික සමාජයන් සම්බන්ධ කරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට ද ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

තව බොහෝ දේ කිරීමට ඇති නමුත්, මේ රටට හා එහි ජනතාවට ඔවුන්ගේ සැබෑ හැකියාව අවබෝධ කර ගැනීමටත්, අභියෝග ජය ගැනීමටත් ශ්‍රී ලාංකික ජනතාව සමග සහයෝගයෙන් කටයුතු කිරීමට එක්සත් ජනපදය ඇප කැප වී සිටී.

**සහකාර ලේකම් ටොම් මැලිනොව්ස්කි**

මින් පෙර කිසි දිනක නො තිබූ තරම් හොඳ තත්වයකින් අපේ සබඳතා පවත්වා ගැනීමට ඔබ කළ සියල්ල වෙනුවෙන් ඇමති සමරවීරට ස්තූති කිරීමට කැමැත්තෙමි. ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ තත්වය යළි ගොඩ නැගීමට හා ශක්තිමත් කිරීමට ඔබ ගෙන ඇති පියවර අපි ඉතා අගය කරන බව සඳහන් කළ යුතුයි. පසුගිය වර්ෂ එකහමාර තුළ ශ්‍රී ලංකාව ලබා ඇති රාජ්‍ය තාන්ත්‍රික සාර්ථකත්වයට බොහෝ දුරට හේතු වූයේ ඔබේ අවංකකම හා ජාත්‍යන්තර ප්‍රජාව තුළ ඔබේ වචනයට ඇති ගරු කිරීමයි. ඒ මගින් මේ රටට සැලකිය යුතු ප්‍රතිලාභ ලැබී තිබේ.

පසුගිය මාස කීපය තුළ, විශේෂයෙන්ම පසුගිය සති කිහිපය තුළ ප්‍රතිසංස්කරණ, ප්‍රජාතන්ත්‍රීකරණය හා ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වැදගත් පියවර ගණනාවක් ගෙන ඇති බව අපි දුටුවෙමු. මේ අතර අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම, අතුරුදහන් කිරීම පිළිබඳ ප්‍රඥප්තිය අනුමත කිරීම, හමුදාව විසින් අතිරේක ඉඩම් නිදහස් කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ ජනාධිපතිතුමාගේ ඉතා වැදගත් නියෝගය හා ව්‍යවස්ථාව සම්බන්ධ කටයුතුවල ප්‍රගතිය ආදිය වේ. මෙම කටයුතුවලින් බොහෝ කොටසක් පසුගිය වර්ෂයේ මානව හිමිකම් මණ්ඩල යෝජනාවේ අඩංගු විය. තම රටේ නීතියේ ආධිපත්‍යය හා වග වීම නැවත ස්ථාපිත කරමින් තමන්ගේ ජාතික යහපත සඳහා ශ්‍රී ලාංකික ජනතාව පෙන්වූ කැපවීම එම යෝජනාවේ අඩංගු විය. එක්සත් ජනපදය එම යෝජනාවේ සම-අනුග්‍රාහකයෙක් වූ බැවින් මෙම ක්‍රියාවලිය ඉදිරියට යන බව සහතික කිරීම අපේ වගකීමක් ද වෙයි. මේ නිසා යෝජනාවෙන් අනුමත වී ඇති ඉතිරි ආයතන හා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවට අවශ්‍ය සහාය සැපයීමට අපි සූදානමින් සිටිමු. මේ අතින් ප්‍රගතියක් ළඟා කර ගැනීමට එක්සත් ජාතීන් හා මහ කොමසාරිස් සෙයිඩ් සමග ඉතා සමීප ව කටයුතු කිරීම ගැන අපි ශ්‍රී ලංකා රජයට ප්‍රශංසා කරමු.

මේ රටේ ජනතාවට හිමි විය යුතු සාමයේ ප්‍රතිලාභ ලබා දීමට අපට ඇති වගකීම හා ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් මගේ සගයා වන සහකාර ලේකම් බිස්වාල් දැක්වූ අදහස් ඉතා ප්‍රබල ලෙස අනුමත කිරීමට කැමැත්තෙමි. අපේ අදහස අනුව ආර්ථික සංවර්ධනය හා

ප්‍රතිසන්ධානය යන අරමුණු දෙක එකිනෙකට බැඳී ඇති බව අවධාරණය කිරීමට කැමැත්තෙමි. සාමයෙන් තොර ව ප්‍රතිසන්ධානයක් ඇති කළ හැකි නොවේ.

ජනතාව වෙන් නොවී එක් වන විට ප්‍රතිසන්ධානය වේගවත් වන බව අපි ලොව පුරා විවිධ රටවල දැක තිබේ. අද ලොව පුරා දකින්නට ලැබෙන සිදුවීම් අතර හොඳ ප්‍රවෘත්ති ඇත්තේ සුළු වශයෙන් නිසා ශ්‍රී ලංකාවේ සිදු වන දෙය ලොව පුරා ජනතාවන්ට වැදගත් වේ. බොහෝ ප්‍රශ්නවලට හේතු වී ඇත්තේ ශ්‍රී ලාංකිකයන් හොඳින් දන්නා කරුණක් වන බෙදීම් මත පදනම් වූ දේශපාලනය හා පොදු යහපත පිළිබඳ දේශපාලනය අතර ඇති ගැටුමයි. අවාසනාවකට මෙන් යහපත් පාලනයක් පවත්වා ගැනීමේ දුෂ්කර කාර්යයට වඩා වාර්ගික, ආගමික හා ජාතික අභිමානය ගැන කථා කිරීමෙන් දේශපාලනයේ දී පහසුවෙන් ජයග්‍රහණය කළ හැකි බව ලොව පුරා බොහෝ ස්ථානවල දී අපි දැක ඇත්තෙමු. අපේ ප්‍රශ්න සම්බන්ධයෙන් වගකීම භාර ගැනීම වෙනුවට අන් අයට වරද පැටවීම පහසු වේ. ඒ මගින් ඔබේ අසාර්ථකත්වය හා දැක්මක් නොමැතිවීම ජනතාවගෙන් වසන් කර ඔවුන්ගේ අවධානය වෙන අතකට යොමු කිරීමට ද හැකි වේ.

ඔවුන් ආවේ කොතනින් ද, ඔවුන් කථා කරන්නේ කුමන භාෂාව ද, ඔවුන් අයත් වන්නේ කුමන ආගමකට ද යනාදිය කුමක් වුවත් සෑම කෙනෙකුට ම ඇත්තේ සමාන මූලික අවශ්‍යතා බව ශ්‍රී ලාංකික ජනතාව නැවත නැවතත් පෙන්වා දී තිබේ. සෑම කෙනෙකුට ම සාමය අවශ්‍ය අතර සෑම කෙනෙකුට ම නීතිය හා යුක්තිය, වගවීම හා රට ඉදිරියට ගෙන යෑම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ජනතාව තෝරා ගෙන ඇත්තේ එකිනෙකාට එරෙහිව ක්‍රියා කරනු වෙනුවට රටේ සියලු ජනයාට සේවය කරන රජයකි. මේ නිසාම ශ්‍රී ලංකාව සාර්ථකත්වයක් කරා ළඟා වීම මුළු ලෝකයට ම අවශ්‍ය වන්නේ ඒ මගින් අන් අයට ද මග පෙන්විය හැකි බැවිනි. මෙම කාර්යයේ දී ඔබේ සහකරුවෙක් වීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු.

ඔබට බෙහෙවින්ම ස්තුතියි.